## සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

## කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ -02 ට අයත් තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම - 2017.

01. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් පහත සඳහන් තනතුරු වල පවතින පුරප්පාඩු විවෘත පදනම මත පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- වෛද්‍ය සැපයීම් සහකාර.
- ආහාර නිරීක්ෂිකා.
- නිවාස භාරකරු/භාරකාරිනී.

02. තනතුරු සඳහා අදාල අධ්‍යාපන සුදුසුකම් :-

**(අ) නිවාස භාරකරු / භාරකාරිනී තනතුර :-** සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිම.

සහ

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරික්ෂණය හැර) සමත් වී තිබිම.

**(ආ) ආහාර නිරීක්ෂිකා :-** සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ ගෘහ විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින්(06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිම.

සහ

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරික්ෂණය හැර) සමත් වී තිබීම.

**(ඇ) වෛද්‍ය සැපයීම් සහකාර :-** සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට හා තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිම.

සහ

වෛද්‍ය සැපයීම් සහකාර තනතුරට පමණක් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යා විෂය සමත්වී තිබිය යුතුය.

03. පළපුරුද්ද:-

- ආහාර නිරීක්ෂිකා සහ වෛද්‍ය සැපයීම් සහකාර තනතුරු සඳහා අදාල නොවේ.
- **නිවාස භාරකරු / භාරකාරිනී** තනතුර සඳහා රජයේ අනුබද්ධ හෝ රජයේ පිළිගත් පුද්ගලික ආයතනයක නේවාසිකාගාරයේ භාරකරු වශයෙන් අවු.02ක පළපුරුද්දක් ලබා තිබිම අතිරේක සුදුසුකමක් සේ සැලකේ.
- **නිවාස භාරකරු / භාරකාරිනී** තනතුරට බඳවා ගැනිමට සුදුසුකම් ලබන්නන් සඳහා මසක ආයතනික පුහුණුවක් ලබාදෙනු ලැබේ.

